# 14

කිසිවෙකුගෙන් බාධාවක් කරදරයක් නැතිව උපසේන උයනේ ඇවිද බලා අනතුරුව ප්‍රධාන මන්දිරයට ආවේය. කෑම ශාලාවේ මේසය මත ආහාරපාන පිළියෙළ වී තිබිණ. අවට කිසිවෙකුත් නොවීය.

උපසේන වට පිට බලා, මේසයේ සිය අපූරු අසුන වෙත හිඳ ගත්තේය. මේසය මත, ආප්ප, ඉඳි ආප්ප, හොදි - සම්බෝල වගී, කෙසෙල් ගෙඩි පාන් ආදිය පිළිවෙලට සකසා තිබුණි. එරේකාගේ අත්වැඩ!

උපසේන වීදුරු පාත්‍රයේ දියෙන් අත සෝදාගෙන බඩ කට පිරෙන්නට ඇති තරම් කෑවේය.

'මෙහෙම හැමදාම ඉන්න තියෙනවනං නරකකුත් නෑ තමයි. අර මිනිහගෙ පොත ලියන්නත් එපැයි. ඒ යකාව හොඳින් තියා ගත්තොත් කියන ඝනංගුවෙන් ගෙදර එක්කාගෙන යාවි.' උපසේන තුළ නොයෙක් ආකාර සිතුවිලි මතුවිය. එහෙත් ඒ එක සිතුවිල්ලකටවත් හරි හැටි ගලායා හැකි කාලසමක මාතෘකාවක්වත් නොවීය.

'කොලිංගයා ජෝන අහලක නෑ.- මගේ ගෙදර ගියා කියන්නෙ අමූලික බොරුවක් - කොහේ හරි රස්තියාදුවක් ගහලා ඇති. සමහර විට ඒ එන ගමන් ගඟසිරි හෝටලයට ගිහින් තේ එකකුත් බීලා කාව හරි දැලේ දාගෙන ඇති. ඊ ළඟට උදලට අනුවෙන කාලකණ්ණි ඇටමස්සා තිබුරුස් මෙන්න ප්‍රශ්නය? අතපය හොඳට තියෙන - වැඩක් පලක් කරන්න අැහැකි අයෙක් තමයි මේ මිනිහා අරගෙන එන්නෙ.'

උපසේන අත සෝදාගෙන නැගිට්ටේය. මේ ශාලාවේ තවම කිසිවෙකුත් නැත. 'මගේම ගෙදර වගේ'. උපසේන පිස්නා කඩකින් අත කෙන මාත්තු කරගෙන මුළුතැන්ගෙය අතට යන කොරිඩෝරයට පිවිසුණේය. ඊයේ රාත්‍රියේ සාදය පැවැත්වුණු ශාලාව පසු කරද්දී ඔහු නිකමට ඒ දොරෙන් කරපොවා බැලුවේය. අර ලොකු මේසය මත තවමත් දුරකථනය සුරැකිව තිබිණ. උපසේනගේ දෑස ඒ අතට ඇදී ගියේ නොසිතාමය. එහෙත් සාවනාව එකඳු ඔහුට දුරකථනය විසංධි කර ඇති බව වැටහුණි. එය ප්‍රතී නිහඬය. උපසේන සාවනා කොටිල්ලට ඇඟිල් තැබූ

වලින් නටවූ කාරේ නොඉවසිලිමත් වේගයකිනි. මොනවා කළත් දැන් මේ දුරකථනය ක්‍රියාකාරී නොවීය. 'කාලිංග ගාන්දර කලපුවෙන් පිටව යන විට මේ ලයින් එක වහලා යනවා ඇති' ; උපසේනට සිතුනි.

ශාලාව සියල්ල අස්පස් කරලාය. ඊයේ රාත්‍රියේ මෙතැන සාදයක් - රති කෙළියක් තිබුණ බවට කිසිම සාක්ෂියක් නොවීය. එහි එකම මතකයක් වශයෙන් ඉතිරිව තිබුණේ පියානෝවයි.

උපසේන පියානෝව වෙතට ගොස් පියන ඇර සිය අතැඟිල්ලෙන් යතුරු කීපයකට තට්ටු කළේය. ස්වර කීපයක සොඳුරු නාද හිස් පරිසරයේ ඈතර ගියේය. අරුතක් නැති ස්වර කීපයක් - -

ඊයේ සන්ධ්‍යාවේ පියානෝව වාදනය කළ දුනුවිල නෝනා අද කොහේ ඇතිද? ගිල්බට් දුනුවිල - අද බෝට්ටුවේ නැගී එතැනින් එගොඩින් ගොඩ බැස තම ගෙදර ගොස් සුව යහනක නැතහොත් ඊයේ රාත්‍රියේ සිදුවූ දෙය ගැන ආවර්ජනයක් කරමින් සුසුම් හෙළනවාද? සමහර විට අද අද සුදු ඇඳගෙන සිල් අරගෙන ඇති... ඒ නැත්නම් ඊයේ රාත්‍රියේ පව් සමාකරන්නට පල්ලියකට යන්නට ඇතිද? එතකොට අර ලෙක්සි - එතැනින් ගියාම - මේසා - සමහර විට තාම නිදි ඇති - හෙට තව පාටියක් - සේරම පුස් ජීවිත... සමහර විට ඊළඟ සාදයට එන්නේ වෙන පිරිසක් විය හැකියි. කාලිංග නම් මකුළුවාගේ ආරාධනයෙන් ඒ මකුළු දැලට එන කුරුමිණි සතුන් - පුස් ජීවිත..

පුළුල් කවුළු වලින් පිටත බැලූ උපසේනට කලපු දියත් එයින් එහාට, සැමදූ නිමාවෙන ගොඩනැගිල්ලත් දෑස ගැටුණි. ගොඩනැගිල්ලේ වැඩ කරන එවුන් නම් තවම නැගිට නැති පාටයි. ඊයේ රාත්‍රී රතියෙන් වෙහෙසට පත් තවම නිදි ඇති - පින්ටා - ගමා - ආන් ද්‍රේ - ඇල්වි -

ගොඩනැගිල්ලට ඉහලින් සුදු වලාකුළු කීපයක් පාවී ගියේ පෙරදා රැයේ [illegible] ගැන මතකයක් නැතුවාක් මෙනි.

උපසේන කවුළුවක් හැරගෙන එයින් පිටතට වා නැඹුරුවේය. තණ ගත තවම වැහිදියෙන් තෙමිලාය. ගස් අතු පත, දියෙන් බරවූවාක් වැනිය. නමුත් තමා නාන්වූවාක් වැනිය. මේ තාත්විකවෙ පුරුකලාවේ සුන්දරත්වයක් විය. නිදහසක් වැනි

හැඟීමක් ඔහු තුළ ඉස්මතු වුවද එය සැබෑ නිදහසක් නොවීය. උපසේන තමා හැඳ සිටි ඩ්‍රෙසිං ගවුම අත ගා බැලුවේය. එය තද රත් පැහැ සේද ගවුමකි. ඔහු තමා අතැති සැරයටිය දෙස බැලුවේය. එයද අගනා කැටයමකින් යුතු සුදුත් පැහැ බස්තමකි. ගවුමේ හා සැරයටියේ ඇත්තේ ද්‍රව්‍යට වෙනෝනා අගයකි. තමාට මේ කිසිවක් අයිති නැතත් මේ දේවල් පරිහරණය කරන්නට ලැබීමම එක්තරා... එක්තරා... එය භාග්‍යයක් නම් නොවේ. ඇතැම් විට පරිප්‍රසාදයක් - තමා, අගනා මෝටර් රථයක් පදවා යන රියැදුරෙක් මෙනි. රියැදුරාට රථය අයිති නොවේ. එහෙත් එය පාලනය කරන්නේ රියැදුරාය එහි ඉදිරි අසුනෙහි සුවපහසුව ලබන්නේ රියැදුරාය. එහෙත් රියැදුරාට වාහනය අයිති නොවේ. ඒ සේම තමා හැඳ සිටින වටිනා ඩ්‍රෙසිං ගවුම, තමාට ආධාරකය වන ~~අ~~ අගනා සැරයටිය තමාට අයිති නොවේ. මේ ඇවිද යන පරිසරය පවා 'තමාගේ' නොවේ.

උපසේන මෙවන් කල්පනාවෙන්ද, තම බිරිඳ හා දරුවා ගැන මතක් කිරීමෙන්ද පිරි සිතිවිලිවලින් කැළඹී ගොසුව පසු කළේය. කුකුළා, කිකිළියන්ගේ කොකරය, වරින් වර ඇසුණි. ඉන් අනතුරුව දුගඳින් පිරි ඌරු ගාල. මඩ දියෙහි ලගින ඌරන් නාසයෙන් හා උගුරෙන් නගනා හඬ සිහිපත් කරන්නේ ර'යේ රාත්‍රී සාදයයි. රාත්‍රී සාදයෙන් ඉතිරි වූ කෑම සියල්ලම මෙන් දැන් තිබුණේ ඌරු ගාලේ බක්කියකයි. උපසේන එතැන පසු කරගෙන එතැන අයිනෙහි වූ තණ ගොල්ලේ බිරිදිය ගොකුණ අතට ඇවිද ගියේය. එතැනින් දකුණට හැරී ඔහු ගියේ ඌරු ගාලෙන් පසු පස වූ බාග බිත්ති හා දැල් සහිත කාමර පෙළ වෙතටයි.

මුල්ම කාමරයේ අඳුරේ කෙනෙක් ගුලි වී සිටියේය. අනෙක් කාමරයේ සිටි තැනැත්තා උපසේන දැක ඉඟින මිරෝ ගත්තේය. ර'ළඟ කාමරයේ සිටි එකා වියරු සිනාවක් පෑවේය. හතරවැනි කාමරයේ කොටු දැල් වලින් බැලූ උපසේන බිරාන්ත වූයේය. එතුළ සිටියේ සමන් බංඩාරයි. සමන් බංඩාර නිරුවතින් - ඇඟ පුරාම මිනි දියට ඇලුනු පිදුරු කැලි එහෙත් මෙහෙත්. අත පය මුහුණ මඩ සහ රොඩු - හරියටම අර ගාලේ ඌරු පැටියෙක් මෙන් සමන් බංඩාර හිස් බැල්මකින් උපසේන දෙස බැලුවේය.

"සමන් ! සමන් බණ්ඩාර !" උපසේන හෙමින් මෙන්ය කතා කළේ.

සමන් බණ්ඩාර කොටු දැල් සීමාව වෙතට ආවේය. 'මේ රටෙ ගොඩට නැඟ නැලළ ගෙන, කාලිංගගෙ අනාදි මිතුරෙක් වගේ හිටිය මිනිහා! අද -? අද මේ මොනව වෙලාද? අසරණව සිර කුටියක- ඈගේ ඇඳුමක්වත් නැතිව. කාලිංග සමන් බණ්ඩාරගේ බල බිඳ දමා යළි වඩියට දමා විද?'

"සමන් බණ්ඩාර"

"ම් ?"

"මොකද මේ උනේ ?"

"මං දූ !"

"කාලිංග අපි දෙන්නගෙම මිතුරෙක්."

"කාලිංග? කවුද?"

"ඊයෙ පාවිය මතකද?"

"ඊයෙ පාවිය? ඔව් ඔව් ඊයෙ පාවිය!"

"සමන් - ඔයාගෙ බිස්නස් සේරම බලා ගන්නෙ කවුද?"

"බිස්නස්? හරි- හරි."

"සමන් - මේ - කවුදෙ සිහි වලවා ගන්නවා - කවුදෙ කාමිපනයක ඉන්නෙ"

"කාමි පන- යක?"

මේ මිනිහා මටත් වඩා අසරණයි, උපසේනට සිතුණි. අනතුරුව උපසේනට සිතුනේ තමාත් දිනෙක මේ තත්වයට පත් වේද්දෝ යි කියායි. එයින් ගැලවීමේ එකම මාර්ගය කාලිංග වෙනුවෙන් පොත ලිවීමයි. කාලිංග ඔහුගේම නමින් එවා ප්‍රකාශ කළත් කමක් නැත - තමාගේ ජීවිතය බේරා, තම බිරිඳත් දරුවාත් දැකගන්නට ඉඩ සලසනවා නම්...

අනතුරුව උපසේනට සිතුණේ සමන් බණ්ඩාර කාලිංගට කොතරම් කුළුපග ව සිටියාද කියායි. කාලිංගයාට හිතවත් උනා කියා එය ගැලවීමේ හේතුවක් නොවෙයි. කාලිංගයා කොයි මොහොතේ අනෙක් පැත්ත හැරෙනවාද දන්නෙ නෑ - මිනිහා සමන් බණ්ඩාරගේ මිතුදම වසීනය කරන්නට ඇත්තේත්, මේ අවස්ථාව උදු කරගන්නට. මේ රාත්‍රී සාදය පැවැත්වෙන්නට ඇත්තේත් මේ අවාසනාවන්ත කාරිය උදෙසාම ---

සමන් බණ්ඩාරගේ සිහිය මේ තරම් ඉක්මනින් මේ තරම්

ඔද්දල් වූයේ ඇයි? මේ කාමරයට ගෙනවුත් දැමූයේ රාත්‍රී කීට යම් කිසි වසක් විසක් දෙන්නට ඇද්ද? ඇතැම්විට බෙහෙතක නියාවෙන්, බෙහෙවියක නාමයෙන් මත් ද්‍රව්‍යයක්. එහෙත් නැත්නම් වන්නකක්--

"සමන් බණ්ඩාර.."

"ම්..?"

"තමුසෙට මාව මතකද?"

"ඔව්.."

"මගෙ නම මතකද?"

"ම්? නෑ"

"මේ, සමන් බණ්ඩාර මං දීපු ලියුමට මොකද උනේ?"

"ලියුම? මොන ලියුමද?"

සිහිය විකල් වූ මිනිසෙකුගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් නොවේ එය. මදැ - තමා දූතයා ලෙස තෝරා ගත් තැනැත්තාට මේ තත්වයට පත් වූ ආකාරය!

තව කාලයක් යනවිට මේ මිනිහාගේ නම - සමන් බණ්ඩාර නොවේ. වෙන මොකක් හෝ ආරූඪ නමක්. කාලිංග දෙන නමක්.

සමන් බණ්ඩාරගේ වත පිට - ව්‍යාපාර සේරම කාලිංග දියවඩනට අයත් වේවි. කාලයාගේ ඇවෑමෙන් සමන් බණ්ඩාර කියා කෙනෙක් සිටියාද කියාවත් ලෝකයාට අමතක වේවි. ඇතැම්විට සමන් බණ්ඩාර දිග කාලයක් මේ ගාර්ඩ් කලාපයේ රෝගියෙකු ලෙස ඉඳීවි. නැත්නම් දිනෙක කලපු දියේ මසුන් කිඹුලන්ට ආහාරයක් වේවි..

උපසේනගේ ගත කිළිපොලා ගියේය. සමන් බණ්ඩාර සේම තමාද අසරණය.

මෙතැන රජයන්නේ කාලිංග දියවඩනම යමනි. සැබැවින්ම සතුටු වන්නේ කීටය පමණි. එහෙත්-- සෑම දෙයක්ම-- සෑම දෙයක්ම තාවකාලික නොවේද?

හමා ආ සීත සුළඟේ, උපසේන තම ගවුම ඇඟට තද කර අල්ලා ගත්තේය. සමන් බණ්ඩාර සිටි කූඩ සිර කුටියේ පසු පස කොටසේ කුඩා දොරක් විවර විය. එතැනින් මතුවූ කෙනෙක් කුටිය තුළට බත් පිඟානක් තල්ලු කළේය. උපසේන ඒ සේවකයාව හැඳින්නේය. කීරිරෝ!